Prepared by- පී.එම්.ජී.බණ්ඩාර.
ගුරු උපදේශක
බළන්ගොඩ අධ්‍යාපන

- සතර අභිනය - අභිනය විලාස.

(01.) මනමේ, සිංහබාහු, හුණුවටයේ කතාව, කැළණි පාලම, තලමල පිපිලා, වැනි නාට්‍යවල පින්තූර කීපයක් එකතු කර ගන්න.

(02.) යම් අදහසක්, සිද්ධියක්, අවස්ථාවක් ඉදිරියට පැමිණවීම හෙවත් ගෙන හැර දැක්වීම අභිනය නම් වේ.

( අභි - ඉදිරියට. නය - පැමිණවීම. )

මේ සඳහා විවිධ උපක්‍රම භාවිතා කරයි

උදා:- ඇඳුම්.

ඔබ දන්නා තවත් අංග දක්වන්න.

(03.) අභිනය ප්‍රධාන වශයෙන් "සතර අභිනය" යනුවෙන් කොටස් හතරකට බෙදා දක්වයි.

(අ.) වාචික අභිනය. (ආ.) ආංගික අභිනය.

(ඇ.) සාත්වික අභිනය. (ඈ.) ආහාර්ය අභිනය.

මෙම එක් එක් අභිනය සඳහා වෙන වෙනම උදාහරණ දක්වන්න.

(04.) පහත සඳහන් කොටස් සඳහා ගැලපෙන අභිනය සඳහන් කරන්න.

(අ.) රවා බැලීම. (ආ.) රජතුමා:- ඔහු වහා මෙහි කැඳවනු.

(ඇ.) නළුවා නරියෙකු මෙන් වෙස්ගන්වා තිබීම.

(ඈ.) කඩුව ගැනීමට අත දිගු කිරීම.

(05.) ඔබ නරඹන වේදිකා නාට්‍යයක අභිනය භාවිතය පිළිබඳව හොඳින් නිරීක්ෂණය කරන්න.